# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM)

# කොළඹ විශ්වවිද්‍යාලය

# අයදුම්පත් සඳහා ආරාධනයයි

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) පවත්නා අධ්‍යක්ෂ තනතුර සඳහා, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා එයට සිදුකළ සංශෝධන සහ 1980 අංක 01 දරන PGIM ආඥාපනත හා එයට සිදුකළ සංශෝධන සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා (UGC) 2024 ජනවාරි 01 දිනැති චක්‍රලේඛ අංක 01/2024 අනුගාමීව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) කළමනාකරණ මණ්ඩලය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් වෙත, මණ්ඩල සහතිකකරණයක් හෝ වෛද්‍ය විද්‍යා විශේෂඥතාවයේ ආචාර්ය උපාධියක් (PhD) (වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයෙහි) තිබිය යුතුය. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, අදාළ අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය වන විට වයස අවුරුදු 63 කට අඩු විය යුතුය. එසේම නව අධ්‍යක්ෂවරයා ලෙස PGIM ආඥාපනතේ ලැයිස්තුගත තනතුරට අදාළ ක්‍රියාකාරකම් හා වගකීම් නිසි ලෙස ඉටුකිරීමේ හැකියාවට අදාළ අවශ්‍ය පළපුරුද්ද තිබීම සමග නායකත්වය ලබාදිය යුතුය. අධ්‍යාපනික හා පරිපාලන ක්ෂේත්‍රවල පෙර පළපුරුද්ද සතුවීම වාසිදායක වනු ඇත. PGIM ආයතනයේ අධ්‍යක්ෂවරයා එම ආයතනයේ පූර්ණකාලීන නිලධාරියකු වන අතර, ඔහු ප්‍රධාන PGIM ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යාපන නිලධාරී හා ගිණුම්කරණ නිලධාරිවරයා ලෙස කටයුතු කළ යුතුවේ. අදාළ සේවා කාලය වසර තුනක් වේ. ඔහු/ ඇය, නිලබලයෙන් PGIM කළමනාකරණ මණ්ඩලයේ හා එහි සියලුම අධ්‍යයන මණ්ඩලවල සාමාජිකයකු වේ.

**අයදුම්පත් සමග පහත සඳහන් ලේඛන තිබිය යුතුය.**

i. යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පතක් (අදාළ අයදුම්පත් PGIM වෙබ් අඩවියෙන් බාගත කළ හැක.)

ii. ආයතනයේ සංවර්ධනය උදෙසා වන දැක්ම පිළිබඳ ප්‍රකාශයක්

iii. අධ්‍යක්ෂ තනතුරට පත්වීම ලදහොත්, අයදුම්කරු විසින් ළඟාකර ගැනීමට අපේක්ෂා කරනු ලබන අරමුණු පිළිබඳව කෙටි විස්තරයක්

iv. තම උපන්දිනය (උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් අමුණන්න) හා ඇමතුම් අංක සමග සම්පූර්ණ ජීවදත්ත (සහායක ලේඛන සහිතව) ඇතුළත් අයදුම්පතක්.

v. දැනට ධුරයේ කටයුතු කරනු ලබන අධ්‍යක්ෂවරයාද අයදුම්කරුවකු වෙතොත් නැතහොත මින් පෙර අවස්ථාවක එලෙස කටයුතු කොට තිබුණහොත් ඔහු/ ඇය විසින් තමන්ගේ එම පෙර සේවා කාලය තුළ ලබාගත් ජයග්‍රහණ පිළිබඳව සඳහන් කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

vi. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හැර වෙනත්, රාජ්‍ය සේවයේ සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා උසස් අධ්‍යාපන ආයතනවල දැනට සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් විසින් තමන්ගේ දැනට සේවයේ නියුතු ආයතන ප්‍රධානියා වෙතින්, තමන් මෙම තනතුරට තෝරාගතහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කාරණය සඳහන් කොට ලිපියක් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

2024 ජනවාරි 01 දිනැති අංක01/2024 දරන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව අදාළ තෝරාගැනීමේ ක්‍රමවේදය සිදුකෙරේ.

අදාළ UGC චක්‍රලේඛ අංක 01/2024 හා PGIM ආඥා පනත, පිළිවෙලින් UGC හා PGIM වෙබ් අඩවිවලින් බාගත කරගත හැක.

අයදුම්පත් මුද්‍රා තැබූ කවරයක බහා, නියෝජ්‍ය ලේඛකාධිකාරී, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 160, මහාචාර්ය නන්දදාස කෝදගොඩ මාවත, කොළඹ 07 යන ලිපිනයට යොමු කොට 2025 ඔක්තෝබර් 07 වන දින ප.ව. 3.00 ට පෙර කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. එයට අමතරව, ඉහත ලැයිස්තුගත ලේඛන (I සිට V දක්වා) හා වෙනත් සහායක ලේඛනද සමග පහත සඳහන් ඊමේල් ලිපිනය වෙත PDF ආකෘතියෙන් මෘදු පිටපතක් ඉදිරිපත් කළ හැකිය. අයදුම්කරුවන් විසින් අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

අදාළ අවසන් දිනයට පසුව ලැබෙන හා ඉහත උපදෙස්වලට අනුකූල නොවන ලෙස සකස් කළ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
**2025 සැප්තැම්බර් 14**
**director-recruitment@pgim.cmb.ac.lk**